මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

---

මාධ්‍ය නිවේදන අංක : **2025/08** **2025.11.14**

**මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා පත්කිරීම පිළිබඳ නිවේදනය**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වූ සමන් ශ්‍රී රත්නායක මහතා 2019.10.16 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ මැතිවරණ කොමසාරිස් ජනරාල් ධුරය දරා නියමිත වයස අවුරුදු හැට සම්පූර්ණ වීම මත 2025.11.13 දින සේවයෙන් පසුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන **රසික පීරිස් මහතා 2025.11.14** දින අභිනව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ලෙස රාජකාරි භාර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

1998 මාර්තු 02 දින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්වීම් ලැබීමෙන් අනතුරුව 1998 සැප්තැම්බර් 15 දින මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස සේවයට එක් වූ රසික පීරිස් මහතා එතැන් සිට සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයෙකු හා අතිරේක මැතිවරණ කොමසාරිස්වරයෙකු ලෙස මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා මැතිවරණ කොමිෂන් සභාවේ අඛණ්ඩව අවුරුදු 27 ක් සේවය කළ ජ්‍යෙෂ්ඨතම මාණ්ඩලික නිලධාරියා වේ.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.